# පෙර භවය කීමේ මහා නුවණ

පූර්ව කර්මයන්ට අනුව ඔබෙත් මගෙත් මේ ජීවිතය සැකසී ඇති බව බෞද්ධ දර්ශනය විසින් අපට උගන්වයි. එසේම අන්‍ය ආගමික දර්ශන විසින්ද ඒ ඒ දෘෂ්ටීන්ට අනුව ජීවිතය පිළිබඳ විවරණයක් ගෙන එයි. කාලය හා අවකාශය තුළ විශ්ව බලයට අනුගත වූ අපි නොනිමි සංසාර ගමනක යෙදෙන්නෙමු. මේ දීර්ඝ ගමන කොතැනින් ආරම්භ වී කොතැනින් නිම වන්නේදැයි කියන්න ඔබට මට හැකියාවක් නැත. ඔබත් මමත් අද දවසේ ගතකරන ජීවිතය තාවකාලික නැවතුමක එක් නිමේෂයක් පමණි. පැරණි සාහිත්‍යකරුවා මෙය ජීවිත අම්බලම ලෙස හඳුන්වා දුන්නේ ගැඹුරු අර්ථයක් ඇතිවය. මේ ආකාරයට කිසිවකුට එහි ස්ථිර වාසය හිමි නොවූ අතර මෙයට සමානව අපේ ජීවිතයද ඉපදෙමින් ටික කලක් පවතිමින් මැරෙමින් නැවැත නැවැත ඉපදෙමින් චක්‍රීය වූ ගමනක යෙදෙයි. අද දවසේ මේ තාවකාලික අම්බලමේ ජීවත් වන ඔබට මට අපි ආවේ කොහේ සිටද යන්නේ කොතැනකටද යන ප්‍රශ්න දෙකට පිළිතුරු සොයාගත හැකිද?



පන්සිය පනස් ජාතක පොත කියවන අපි බුදුන් වහන්සේගේ බුද්ධත්වයට පෙර බෝසත් ජීවිත 550ක් පිළිබඳ චරිත කතා අවබෝධ කොට ගන්නෙමු. බුද්ධත්වයෙන් හෝ වෙනත් අධිගම ලාභයකින් තමන් විසූ පෙරකඳ පිළිවෙත (ජාතිස්මෘති ඥානය) ලද හැකි බැව් බුද්ධ දර්ශනය උගන්වයි. එසේම එවැනි උතුමන්ට අනුන්ගේ පෙර භවයන් ගැන මනාසේ කියත හැකි බව දැක්වේ. මේ බවට ගෙනහැර පෑ හැකි උදාහරණ බොහෝය. ඔබට හෙට්ටිමුල්ලේ රාහුල හිමියන් විසින් රචිත කාලය හා අවකාශය නමැති කෘතිය අධ්‍යයනය කළ හැකි නම් අපේ සංසාරගත භවගාමී ජීවිතය පිළිබඳ යම් අවබෝධයක් ලැබෙනු ඇත. බුද්ධ දර්ශනයට අනුව මිනිසුන් සතුන් ලෙසත්, සතුන් මිනිසුන් ලෙසත් එසේ නැතිනම් දේව, යක්ෂ, ප්‍රේත... ආදී කොට්ඨාස ලෙසත් වරින් වර කර්මානුරූපව ඉපදෙන මැරෙන බව උගන්වයි. එසේ නමුත් ක්‍රිස්තුස් වහන්සේ එයට වඩා මඳක් වෙනස් මතයක් ඉදිරිපත් කරති. ඒ බව ජිනා සෙර්මිනාරා මෙනවිය විසින් ලියන ලද පණ්ඩිත කණ්නිමහර සුමංගල හිමි විසින් පරිවර්තනය කරන ලද සංසාර මන්දිර (Many Manlons) නමැති කෘතියේ දැක්වේ.

මීට අමතරව පණ්ඩිත කන්නිමහර සුමංගල හිමි විසින්ම පරිවර්තනය කරන්න යෙදුණු බ්‍රයිඩේ මෘර්ෆි හා අන්තරාභවය (The Search for Bridey Murphy) කෘතියේ මිනිසුන් මෝහනයට පත්කිරීමෙන් ඔවුන්ගේ පූර්ව ජන්ම ජීවිත ගැන සොයාගත හැකි අයුරු දක්වයි.

තවත් බොහෝ නිදසුන් ඇතත් ලිපිය දීර්ඝ වන නිසා නිදසුන් දැක්වීම මෙතැනින් හමාර කරමි. මේ සියලු කරුණු සලකා බලන කල ලෝකයේ ජීවත් වන මිනිසුන් තමන්ගේ පෙර ජීවිතය පිළිබඳ කාණ්ඩ වශයෙන් මෙසේ සිතනු ඇත. ඔවුන් අතර මට පෙර භවයක් තිබිණි යැයි විශ්වාස

> පන්සිය පනස් ජාතක පොත කියවන අපි බුදුන් වහන්සේගේ බුද්ධත්වයට පෙර බෝසත් ජීවිත 550ක් පිළිබඳ චරිත කතා අවබෝධ කොට ගන්නෙමු. බුද්ධත්වයෙන් හෝ වෙනත් අධිගම ලාභයකින් තමන් විසූ පෙරකළ පිළිවෙත (ජාතිස්මෘති ඥානය) ලද හැකි බැව් බුද්ධ දර්ශනය උගන්වයි.

කරන්නෝද එසේ විශ්වාස නොකරන්නෝද සිටිය හැකිය. ඔබ දන්නා පරිදි බොහෝ දෙනෙක් පුනර්භවය, පුනරුප්පත්තිය විශ්වාස කරති. මේවායේ එන වචනාර්ථයන් පිළිබඳ යම් යම් මතගැටුම් හා වාද විවාද පවතින්න පුළුවන. මේ ලිපිය කියවන ඔබද ඉහත සඳහන් යම් මතයක් දරනවා විය හැකිය.

කෙසේ නමුදු ආගමික හා අනෙකුත් දෘෂ්ටිවාදයන්ගෙන් බැහැරව ගුප්ත විද්‍යාව තුළින් මේ ධර්මතාවයේ සත්‍ය අත්දකින්න උත්සාහයක යෙදෙමු. ඔබගෙත් මගෙත් පෙර අත්භවය (පෙර ගතකළ ජීවිතය) ගැන අසා දැනගන්න හැකි අයකු නූතන ලෝකයේ සිටිනවාද යන්න සැක සහිතය. ඇතැම් විට ඔබට එවැනි බලයක් පිහිටා තිබිය හැකිය. මා එසේ කියන්නේ එවැනි පුද්ගලයන් තවමත් ලෝකයට බිහි විය හැකි සාධක තිබෙන නිසාය. එවන් පුද්ගලයකු ලොවට බිහිවන්නට ඉර-හඳ තාරකාවන්ගේ අන්තරීක්ෂණ බලය සෘජු ලෙසම බලපානු ඇත. අන්තරීක්ෂ බලය තුළ තිබෙන්නා වූ ජාතිස්මෘති සහිත පරමාණුක ශක්තීන් අන්තරාභවික විඥානය හා යෝග වීමෙන් මෙවන් පුද්ගලයන් බිහිවිය හැකිය. ජාතිස්මෘතිය ප්‍රගුණ කළ හැකි සිතක් සසර පුරා පවත්වාගෙන එන්නන් තුළද මේ හැකියාව පවතිනු දක්නට පිළිවන. නිදසුන් ලෙස එඩ්ගා කේශි, සිග්මන් ෆ්‍රොයිඩ්, මෝරි බෙර්න්ස්ටයින් වැනි පුද්ගලයෝ නූතන ලෝකය තුළින් සොයාගත හැකිය. ඇතැම්විට ඔබටත් කුඩා කල මේ හැකියාව තිබුණා විය හැකිය. ජ්‍යොතිෂ විද්‍යාවට අනුව එවන් පුද්ගලයන් බිහි විය හැකි ආකාර ගණනාවක් ඔබ වෙනුවෙන් ඉදිරිපත් කරමි. යමකුගේ අන්තරීක්ෂ බල සටහනක මෙම පිහිටීම් තිබේ නම් නිත්‍ය ලෙසම ඔහුට තමාගේ සේම අන් අයගේද පෙර භවයන් කියන්නට හැකි වෙයි.

අන්තරීක්ෂ බල රාශිය කුම්භය වී එහි පස්වැන්නේ හිරු ග්‍රහයාද පුණ්‍යස්ථානයේ හෙවත් නව වැන්න අධිපති ශුක්‍ර ග්‍රහයා ස්වක්ෂේත්‍රව සිවු වැන්නේද වෘශ්චික රාශිය තුළ කුජ ගහයා දස වැන්නේද ගුරු, ශනි හා රාහු සමඟ එකොළොස්වැන්නේද මීන රාශිය තුළ සඳු ග්‍රහයා හා බුධ ග්‍රහයාද සිටිමින් හයවැනි ස්ථානය රාහුට දර්ශනය වෙමින්ද යමකු උපන් කල්හි ඒ අය මනා ලෙස ජාතිස්මෘති ඥානය ඇත්තෝ බවට පත්වෙති.

මේ අයුරින් පරීක්ෂා කර බලා ඔබට හෝ ඔබ දන්නා අයකුට මෙම බලගතු ඥානය තිබේ දැයි දැනගන්න.



පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක
**උපුල් එස්. දෙඹේපොළ**
0772042708